## 2026 මාර්තු මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**උත්සව සමයේ ඉහළ ඉල්ලුමත් සමග නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරකම් ඉහළ යෑම හේතුවෙන්, නිෂ්පාදන අංශයේ ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2026 මාර්තු මාසයේ දී දර්ශකාංක 66.7ක් දක්වා ඉහළ ගියේය.** කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය, ඉහළ යන නිෂ්පාදන පිරිවැය සහ සැපයුම් සීමාවන් හේතුවෙන්, සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙකු විසින් සීමාකාරී නිෂ්පාදන වාතාවරණයක් පිළිබඳව වාර්තා කරන ලදී.

විශේෂයෙන්, ආහාර පාන සහ රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශ තුළ, නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශක වර්ධනය විය. නිෂ්පාදන ඉල්ලුම වැඩිවීමට අනුකූලව තොග මිලදී ගැනීම් උප දර්ශකය ද වර්ධනය විය. තවද, මැදපෙරදිග ගැටුම් හේතුවෙන් ඇති විය හැකි බාධාවන්ගෙන් තම නිෂ්පාදන ක්‍රියාවලීන් ආරක්ෂා කර ගැනීම සඳහා අමතර තොග රැස්කිරීම් ඇතැම් නිෂ්පාදන ආයතන වාර්තා කළේය. මාර්තු මාසයේදී සේවා නියුක්ති දර්ශකය සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. මේ අතර, විශේෂයෙන්, ඉල්ලුම ඉහළ යෑම සහ නාවික ප්‍රවාහනය ආශ්‍රිත බාධා හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය තවදුරටත් දීර්ඝ විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**


| විචල්‍යය | පෙබ. | මාර්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.8** | **66.7** | **+** | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නව ඇණවුම් | 55.0 | 69.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 54.5 | 68.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 58.6 | 55.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 60.0 | 59.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 59.6 | 75.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි කාර්තුව තුළ නිෂ්පාදන ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා කඩඉම් මට්ටමට වඩා ඉහළින් පැවතුනද, මැද පෙරදිග පවතින ගැටුම්කාරී වාතාවරණයෙන් ඇතිවන අවිනිශ්චිතතා හේතුවෙන් එහි යම් අඩුවීමක් දක්නට ලැබුණි.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
2026 මාර්තු
**66.7**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට / කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 අප්‍රේල් 16 වන දිනට (PMI Releases (spglobal.com))*

*[1] එස් &පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරමින්, 2026 මාර්තු මාසයේ දී දර්ශකාංක 59.4ක අගයක් වාර්තා කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ මෙම වර්ධනයට බොහෝ අංශවල දක්නට ලැබුණු වැඩිදියුණු වීම් හේතු විය. මෙහිදී ඒ සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා අංශයෙහි ණය ලබා දීමේ ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් සිදු වූ වර්ධනය ප්‍රධාන විය. මීට අමතරව, උත්සව සමයේ ඉල්ලුම හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම ආශ්‍රිත ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, වෘත්තීය සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා ක්‍රියාකාරකම් ද සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය.

මූල්‍ය සේවා අංශයේ ප්‍රධාන දායකත්වයෙන් 2026 මාර්තු මාසයේ දී නව ව්‍යාපාරවල ඉහළ යෑම තවදුරටත් පැවති අතර, රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රියාකාරකම් වල දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය ද ඒ සඳහා උපකාරී විය.

එළඹෙන උත්සව සමයත් සමග ඉහළ යන පාරිභෝගික ඉල්ලුමට සරිලන පරිදි ආයතන විසින් සිය ශ්‍රම බලකාය පුළුල් කිරීම හේතුවෙන්, 2026 මාර්තු මාසයේදී සේවා නියුක්තිය තවදුරටත් ඉහළ ගියේය. නිම කිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගියද, එම පහළ යාමේ වේගය මාසය තුළ දී මන්දගාමී විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2026 පෙබ. | 2026 මාර්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** | **54.4** | **59.4** | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **නව ව්‍යාපාර** | 53.8 | 57.6 | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| **සේවා නියුක්තිය** | 55.1 | 54.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **නිම කිරීමට නියමිත කාර්යයන්** | 65.9 | 48.1 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| **අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්** | 65.9 | 57.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි කාර්තුව සඳහා ව්‍යාපාරික කටයුතු පිළිබඳ අපේක්ෂාවන් ශක්තිමත් මට්ටමක පවතින අතර, ඍතුමය ඉල්ලුම සහ වර්තමාන භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ ඇති විය හැකි නව අවස්ථා ඒ සඳහා පිටුවහලක් වී ඇත. කෙසේ වෙතත්, මැද පෙරදිග ගැටුම්වල බලපෑම සහ පුළුල් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවය ඇතුළුව, ඉදිරි දැක්ම කෙරෙහි ඇති විය හැකි අහිතකර අවදානම් පිළිබඳව ඇතැම් ආයතන විසින් අවධාරණය කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**

**59.4**

**2026 මාර්තු**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| **ගෝලීය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **ඉන්දියාව** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **චීනය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **එක්සත් ජනපදය** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| **එක්සත් රාජධානිය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| **යුරෝපා කලාපය** | අඩු වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 අප්‍රේල් 16 වන දිනට*

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිම කිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.